*සැ. යු.* - 2025.10.24 දින පළ කරන ලද අංක 2460 *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,463 - 2025 නොවැම්බර් මස 14 වැනි සිකුරාදා - 2025.11.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )

# II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... | 408 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 දෙසැම්බර් මස 05 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 නොවැම්බර් මස 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2025 ජූනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාල,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.* )

මෙම *ගැසට් පත්‍රය* www. documents. gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම

**මහර දිසා අධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම,
සංශෝධිත නාමය - මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී.,
අංක 236, ගාලු පාර, කොළඹ 03.

නඩු අංකය : DMB 46/15
ඇස්කිසි අංකය : 204/2025

*...........පැමිණිලිකරු.*

*එදිරිව*

රාජපක්ෂ පතිරගේ නිශාන්ත රාජපක්ෂ,
අංක 206/C, පහළ කරගහමුණ, කඩවත.

*.............විත්තිකරුවන්.*

ඉහත නම් සඳහන් විත්තිකරු වෙතය.

ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2015 ක් වූ මැයි මස 20 වැනි දින දරන තීන්දු ප්‍රකාශය ප්‍රකාර ඉහත නම් සඳහන් විත්තිකරු විසින් පැමිණිලිකාර සමාගම වෙත ගෙවිය යුතුව ඇති රුපියල් පහළොස් ලක්ෂ හැටහතර දහස් තුන්සිය අනූ අටයි ශත අනූවක (රු. 1,564,398.90) ක මුදල සහ එම මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තෙක් ප්‍රධාන ණය මුදල මත වර්ෂයකට 27% ක් බැගින් වූ පොළියක් ද, හිඟ තබන ලද වාරික මත 5%ක දඩ පොළිය සහ වෙනත් වියදම් ද ගෙවීමටත්,

රුපියල් පහළොස් ලක්ෂ හැටහතර දහස් තුන්සිය අනූ අටයි ශත අනූව (රු. 1,564,398.90) ක මුදල හා එම මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තෙක් ප්‍රධාන ණය මුදල මත වර්ෂයකට 27%ක් බැගින් වූ පොළිය ද, හිඟ තබන ලද වාරික මත මසකට 5%ක දඩ පොළිය සහ වෙනත් වියදම් ද ගෙවීමට නියම කරන ලෙස ද, සියලුම අයකිරීම් තීන්දු ප්‍රකාශයේ දින සිට මාස 2ක් තුළ දී හෝ එකී තීන්දු ප්‍රකාශයෙන් අධිකරණය විසින් නියම කරන ඊට වඩා දීර්ඝ කාලයක දී ගෙවීම් පැහැර හරින්නේ නම් මෙහි පහත උපලේඛනයේ විස්තර වන හා වර්ෂ 2014.04.07 වැනි දින ප්‍රසිද්ධ නොතාරිස් ජයංකා ඩී. කහවෙව්තාන විසින් ලියා සහතික කරන ලද අංක 1000 දරන උකස් බැඳුම්කරය යටතේ ඇප වශයෙන් තබා ඇති එකී ඉඩම හා ඊට අදාළ දේපළ අධිකරණය විසින් පත්කරන බලයලත් වෙන්දේසිකරුවෙකු ලවා අධිකරණය විසින් අනුමත කරන විකිණීමේ කොන්දේසි මත ප්‍රසිද්ධ වෙන්දේසිකරුවකු ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලෙසටත්,

එකී වෙන්දේසිකරුට පහත දැක්වෙන විධානයක් කිරීමට බලය දෙන ලෙසත්,

i. මෙහි උපලේඛනයේ විස්තර වන ඉඩම් ස්ථානය පළමුව ඔහුගේ තක්සේරුව මත වූ මුදලට විකිණීමට ද, එකී තක්සේරුවට කිසිම ඉල්ලුම්කරුවෙකු නොමැති නම් ඉන්පසු ඉහළම ඉල්ලුම්කරුට විකිණීමට ද, එවැනි ඉහළ ඉල්ලුම්කරුවකු නොමැති නම් අධිකරණයේ තක්සේරු මුදලට විකිණීමට ද,

ii. පැමිණිලිකරුට හෝ පැමිණිලිකරු වෙනුවෙන් වෙනත් කෙනෙකුට හෝ අධිකරණය විසින් නියම කරන යම් නියම මත එකී ස්ථානය මිල දී ගැනීමට ඉඩ දෙන ලෙසත්,

iii. එකී වෙන්දේසිකරු හෝ අධිකරණය විසින් පත් කරන ලද වෙනත් නිලධාරියකු හෝ නිලධාරින් විසින් මිල දී ගන්නා වෙනුවෙන් හෝ එවන් විකිණීමේ කොන්දේසි පිළිපැදීමෙන් සහ පහත සඳහන් දේ ඉදිරිපත් කිරීමෙන් නැවත පැවරීමෙන් හෝ පැවරීමක් ලියා අත්සන් කිරීමට බලය පැවරීමට හා අණ කිරීමට,

iv. මිල දී ගන්නා පැමිණිලිකරු නම් ඒ සඳහා අවසර දෙන නියෝගයක් සහ මිල දී ගන්නා තුන්වන පාර්ශවයක් නම් මිලදී ගත් මුදල අධිකරණයේ නිසි පරිදි තැන්පත් කරන ලෙස අධිකරණයට නියෝග කරමින් නියෝගයක් සහ,

v. ඉහත කී විකිණීම ස්ථිර කරමින් නියෝගයක් ද,

vi. ඉහත කී විකුණන ලද ඉඩම සහ ස්ථානයේ හිස් සහ නිරවුල් භුක්තිය මිල දී ගන්නාට හෝ ගන්නන්ට ලබාදෙන ලෙස අදාළ පළාතේ පිස්කල් නිලධාරින් වෙත අණ කරන ලෙසත්,

නඩු ගාස්තු සහ මෙහි විශේෂයෙන් අයැද නොමැති ගරු අධිකරණයට සුදුසු යැයි හැඟෙන වෙනත් සහ වැඩිමනත් සහනයන් ගෙවීමටත්,

එකී නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති දේපළ තහනමට ගෙන විකිණීමේ ඇස්කීසියේ බලය පිට මා විසින් තහනමට ගෙන ඇති,

ඉහත විත්තිකරු සතු නිශ්චල දේපළ,

**වර්ෂ 2025 දෙසැම්බර් මස 15 දින පෙ. ව. 11.00 ට**

කඩවත, පහළ කරගහමුණ, අංක 206/C දරන ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින්,

(i) මුල් ගැණුම් මිලෙන් 25%ක මුදලක් ද,
(ii) තක්සේරු ගාස්තුව වන 0.5% ක් ද,
(iii) වෙන්දේසි ගාස්තු සහ රජයේ ගාස්තු ද,
(iv) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වන වගන්තිය ප්‍රකාර පිස්කල් ගාස්තු,
(v) විකිණීම සඳහා වන සියලුම ගාස්තු.

විකිණීම අවසන් වූ වහාම ගැණුම්කරු විසින් අදාළ මුදල, මුදලින් මා වෙත (වෙන්දේසිකරු) ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් ගෙවන ලද්දේ 25% ක මුදලක් පමණක් නම් ගැණුම් මිලෙන් ඉතිරි මුදල වන 75% ක මුදල දින 30ක් ඇතුළත කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, අධිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහර ප්‍රාදේශීය සභා බලසීමාව තුළ, අංක 429, පහළ කරගහමුණ ග්‍රාම සේවා වසමේ පහළ කරගහමුණ පිහිටි, මිල්ලගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. බී. එල්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද 1999.02.18 දින අංක 3431 දරන ප්ලෑනයේ පෙනෙන ලොට් 1සී දරන ඉඩමට මායිම්, උතුරට : ගල්රෝද පාර, නැගෙනහිරට : ගල්රෝද පාර සහ සිසිර සමන්තට අයිති ඉඩම ද, දකුණට : සිසිර සමන්තට අයිති ඉඩම සහ කැබලි අංක 1ඊ ද, බස්නාහිරට : කැබලි අංක 1බී සහ 1ඊ දරන කොටස් ද යන මායිම් තුළ වන පර්චස් හයයි දශම බිංදුවයි දෙක (පර්. 6.02) ක් විශාල ඉඩම හා ඒ මත පිහිටි ගහකොළ, පළතුරු ආදී සියලු දේ ද සමග වේ. මෙය මහර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 544/167 හි ලියාපදිංචි වී ඇත.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
මහර.

වර්ෂ 2025ක් වූ ඔක්තෝබර් මස 15 දින දී ය.

11-136

පානදුර තොටමුනේ තල්පිටි දෙබැද්දේ (වාද්දුව උපකාර්යාලයේ) පානදුර ප්‍රාදේශීය සභා සීමාව පානදුර ලේකම් කාර්යාලයේ අංක 697A තල්පිටිය දකුණ ග්‍රාම නිලධාරි වසම තුළ තල්පිටිය ගමේ පිහිටි "කිරිපැල්ලගහවත්ත සහ හීන්කතාවැල්ල ඕවිට ඉරවැල්ල" නැමැති ඉඩමේ නිවසක් සහිත ඉඩම් කොටස

**පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි**

කොළඹ දී පවත්වනු ලබන සිවිල් (වාණිජ) අධිකරණ බලය ක්‍රියාත්මක කරන බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයේ දී ය

මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී,

*පෙර,*

මර්චන්ට් ක්‍රෙඩිට් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ්,
ලංකා බැංකු මර්චන්ට් කුළුණ,
අංක 28, ශාන්ත මයිකල් පාර,
කොළඹ 3

*...........පැමිණිලිකරු.*

| | |
|---|---|
| නඩු අංකය | : CHC/619/2009/MR |
| ස්වභාවය | : උකස්කර |
| කාර්ය පටිපාටිය | : සාමාන්‍ය |
| වටිනාකම | : රු. 5,000,000/- |
| ඇස්කිසි අංකය | : 50/2025 |

*එදිරිව*

හේවාකෝන් ඉන්ද්‍රානි පෙරේරා,
අංක 474-F, කබුරගල්ල වත්ත,
රුක්ගහවිල.

*.............විත්තිකාරිය.*

කොළඹ වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති දේපළ විකිණීමේ අධිකාරි පත්‍රයට අනුව නඩුවේ ඇතුළත් කර ඇති වර්ෂ 2024 ක් වූ මාර්තු මස 28 දිනෙන් සංශෝධිත වර්ෂ 2018ක් වූ පෙබරවාරි 05 දිනැති තීන්දු ප්‍රකාශය අනුව ඉහත විත්තිකාරිය විසින් පැමිණිලිකාර බැංකුවට ගෙවිය යුතු පැමිණිල්ලේ සඳහන් නඩු නිමිත්ත මත කෙටි කාලීන ණය අංක KUCRTL 0800198100 යටතේ 2009.07.14 දිනට රු. 4,976,250/23 ක මුදලක් සහ 2009.07.15 දින සිට සම්පූර්ණ මුදල ගෙවා අවසන් කරනු ලබන තෙක් මසකට 4% බැගින් පොළිය ද සමග අයකර ගැනීම සඳහා ආඥා කරමින් නියෝග කර ඇති හෙයින් ද,

මෙහි පහත උපලේඛනයේ වඩාත් විස්තරවන පානදුර තොටමුනේ තල්පිටි දෙබැද්දේ (වාද්දුව උප කාර්යාලයේ) පානදුර ප්‍රාදේශීය සභා සීමාව පානදුර ලේකම් කාර්යාලයේ අංක 697ඒ, තල්පිටිය දකුණ ග්‍රාම නිලධාරි වසම තුළ තල්පිටිය ගමේ පිහිටි 'කිරිපැල්ලගහවත්ත සහ හීන්කතාවැල්ල ඕවිට ඉරවැල්ල" නැමති ඉඩමේ නිවසක් සහිත පර්චස් එකොළහක් (පර්. 11.00) සහ හෙක්ටයාර් 0.02782) විශාලත්වයෙන් යුත් ඉඩම වෙන්දේසියේ විකුණන ලෙසට මා වෙත නියෝග කර ඇති බැවින් එම දේපළ පිළිබඳ වෙන්දේසිය

**වර්ෂ 2025ක් වූ දෙසැම්බර් මස 05 දින ප. ව. 12.30 ට**

දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

*දේපළට පිවිසෙන මාර්ගය.-*

කොළඹ කොටුවේ සිට ගාලු පාර ඔස්සේ පානදුර නගරය පසුකර කි. මී. 31 වැනි කණුව දක්වා ගමන් කර එතැන් සිට ගාල්ල දෙසට තවත් මීටර් 75ක් පමණ ගමන්කර දකුණට පිහිටා ඇති අඩි 16ක් පළලැති කොන්ක්‍රීට් දමා නිම කර ඇති පාරේ මීටර් 150 ක් පමණ ගමන් කිරීමෙන් පසු පාරේ දකුණු පසින් පිහිටි ගාලු පාරේ වරිපනම් අංක 312 දරන නිවසේ සිට පිහිටා ඇති 3 නිවස වේ.

*වෙන්දේසියේ ගෙවීමේ ක්‍රමය.-*

වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් කොළඹ වාණිජ මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් වන මා වෙත පහත දැක්වෙන පරිදි මුදල් ගෙවිය යුතුය. සියලුම ගෙවීම් මුදලින් හෝ බැංකු අණකරවලින් පමණක් ගෙවිය යුතුය. චෙක්පත් බාරගනු නොලැබේ.

01. සම්පූර්ණ විකුණුම් මුදලින් සියයට විසිපහක (25%) මුදලක් එවලේම මා වෙත ගෙවිය යුතුය. විකුණුම් මුදලේ ඉතිරි සියයට හැත්තෑපහක (75%) මුදල වෙන්දේසි දින සිට දින තිහක් (30) ඇතුළත කොළඹ වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවේ බැරට තැන්පත් කළ යුතුය.

02. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය යටතේ වන පිස්කල් ගාස්තු හා රජයේ ගාස්තු ද එම අවස්ථාවේදී ම මා වෙත ගෙවිය යුතුය.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ තල්පිටි දෙබැද්දේ (වාද්දුව උප කාර්යාලයේ) පානදුර ප්‍රාදේශීය සභා සීමාව, පානදුර ලේකම් කාර්යාලයේ අංක 697ඒ, තල්පිටිය දකුණ ග්‍රාම නිලධාරි වසම තුළ, තල්පිටිය ගමේ පිහිටි 'කිරිපැල්ලගහවත්ත සහ හීන්කතාවැල්ල ඔවිට- ඉරවැල්ල" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එම්. ආර්. ජයසේකර මහතා විසින් මැන සාදන ලද අංක 1341 දරන සහ වර්ෂ 1999.07.22 දිනැති පිඹුර ප්‍රකාරව කැබලි අංක B ට මායිම්, උතුරට : පෙරේරා යන අයට අයත් ඉඩම, නැගෙනහිරට : 1978.08.08 දින දරන අංක 426 දරන පිඹුරේ කැබලි අංක 04, දකුණට : අඩි 16 පළල පාරක් සඳහා වෙන් කරන ලද කැබලි අංක 22 සහ බටහිරට : අංක 1341 දරන පිඹුරේ කැබලි අංක A යන මායිම් තුළ පිහිටි පර්චස් එකොළහක් (පර්. 11) ක් සහ හෙක්ටයාර් 0.02782 විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පලතුරු ආදි සියලු දේ ද සමග වේ. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 570/111, 206 දරන පත් ඉරුවල ලියාපදිංචි වී ඇත.

ඉහත කී පිඹුරු අංක 1341 හි කැබලි අංක B පහත ඉඩමෙන් බෙදා වෙන් කරන ලද්දකි.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ තල්පිටි දෙබැද්දේ (වාද්දුව උප කාර්යාලයේ) පානදුර ප්‍රාදේශීය සභා සීමාවේ, තෙලිපිටිය ගමේ, ගාලු පාරේ, වරිපනම් අංක 312/10, 'කිරිපැල්ලගහවත්ත සහ හීන්කතවැල්ල ඔවිටඉරවැල්ල" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. ඩබ්ලිව්. එල්. ද සිල්වා මහතා විසින් මැන සාදන ලද අංක 10875 සහ 1993.10.20 දින දරන පිඹුර ප්‍රකාරව කැබලි අංක 3 ට මායිම්, උතුරට : පෙරේරා යන අයට අයත් ඉඩම, නැගෙනහිරට : 1978.08.08 දින දරන අංක 426 දරන පිඹුරේ කැබලි අංක 04, දකුණට : අඩි 16 පළල පාරක් සඳහා වෙන් කරන ලද කැබලි අංක 22 සහ බටහිරට : 1978.08.08 දින දරන අංක 426 දරන පිඹුරේ කැබලි අංක 02 යන මායිම් තුළ පිහිටි පර්චස් විසි එකයි දශම පහයි බිංදුවක් (පර්. 21.50) ක් සහ හෙක්ටයාර් 0.0544 විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පලතුරු ආදි සියලු දේ ද සමග වේ. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 307/171 සහ, F 570/111 දරන පත් ඉරුවල ලියාපදිංචි වී ඇත.

ඉහත කී පිඹුරු අංක 10875 හි කැබලි අංක 3 පහත ඉඩමෙන් බෙදා වෙන් කරන ලද්දකි.

පාරක් සඳහා වෙන් කරන ලද පහත සඳහන් ඉඩම් කැබැල්ල ද සමග වේ.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ පානදුර තල්පිටි දෙබැද්දේ (වාද්දුව උප කාර්යාලයේ) පානදුර ප්‍රාදේශීය සභා සීමාවේ, තෙලිපිටිය ගමේ, 'කිරිපැල්ලගහවත්ත, හීන්කතවැල්ල, ඔවිටඉරවැල්ල" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු වයි. එම්. පී. බී. කරුණාසුන්දර මහතා විසින් මැන සාදන ලද අංක 426 සහ 1978.08.08 දින දරන පිඹුර ප්‍රකාරව කැබලි අංක 22 ට මායිම්, උතුරට : මෙම ඉඩමේ කැබලි අංක 1,2,3,4,5 සහ 7, නැගෙනහිරට : කොළඹ - ගාල්ල ප්‍රධාන මාර්ගය, දකුණට : මෙම ඉඩමේ කැබලි අංක 8,9,10,11,12 සහ 13, බටහිරට : මෙම ඉඩමේ කැබලි අංක 01 යන මායිම් තුළ පිහිටි පර්චස් විසි දෙකයි දශම හතක් (පර්. 22.7) ක් විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පලතුරු ආදි සියලු දේ ද සමග වේ. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 266/85 සහ F 370/292 දරන පත්ඉරුවල ලියාපදිංචි වී ඇත.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
කොළඹ වාණිජ මහාධිකරණය,
කොළඹ 12.

වර්ෂ 2025ක් වූ නොවැම්බර් මස 03 වැනි දින,
කොළඹ වාණිජ මහාධිකරණයේ දී ය.

11-124

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.